# මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
# மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
# Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk

e-mail: psc.cp.gov@gmail.com

කාර්යාලය / காரியாலயம் / Office – 081-2213097
ලේකම් / செயலாளர் / Secretary – 081-2213096
සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary – 081-5631321
ෆැක්ස් / பெக்ஸ் / Fax – 081-2213082, 081-2213096


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CPC/PSC/10/SUP/පොදු | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023.04.20 |

මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්,
මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්,
මධ්‍යම පළාත් සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියලුම ආයතන ප්‍රධානීන් වෙත

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය නිලධාරීන් විසින් අත්කරගත යුතු රාජ්‍ය භාෂා ප්‍රවීණතාව</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගෙන් සිදුකරන ලද විමසීමකට අදාළව 2022.12.16 දින රැස් වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි 06 ඡේදයේ සඳහන් නියාමන කමිටුව විසින් පහත සඳහන් තීරණ ලබාදී ඇති බව ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST-2/05/OL/0092-I හා 2023.01.10 දිනැති ලිපියෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී ඇත.

I. කළමනාකරණ සේවා නිලධාරී සේවයේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව හෝ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කර ඇති නිලධරයන්, කළමනාකරණ සේවා නිලධාරී අධි ශ්‍රේණියේ පරිපාලන නිලධාරී තනතුරට උසස්වීම් ලද පසුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කිරීම සඳහා පැය 200ක භාෂා පුහුණු පාඨමාලාවක් නැවත හැදෑරීම අවශ්‍ය නොවන බව තීරණය කරන ලදී.

II. 2007.07.01 දිනට පෙර කළමනාකරණ සේවා නිලධාරී සේවයේ පත්වීම් ලද නිලධරයන්, 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 නිකුත් කිරීමෙන් පසුව කළමනාකරණ සේවා අධි ශ්‍රේණියේ පරිපාලන නිලධාරී තනතුරට උසස්වීම් ලද පසු අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කිරීම සඳහා පැය 200ක භාෂා පුහුණු පාඨමාලාවක් සම්පූර්ණ කිරීම අවශ්‍ය නොවන බව තීරණය කරන ලදී.

02. මෙකී ලිපියේ තීරණ මධ්‍යම පළාත් සභාවේ සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන් ඇතුළු MN 7 වැටුප් කේතය දරණ තෘතියික සේවා මට්ටමේ තනතුරුවල සේවයේ නියුතු සියළු නිලධාරීන් සඳහා අදාළ කරගැනීමේ හැකියාව සම්බන්ධයෙන් උපදෙස් ලබාදෙන ලෙස ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දෙන ලදී.

03. එහිදී, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරී අධි ශ්‍රේණියේ නිලධරයන් සඳහා ඉහත තීරණ, අදාළ කරගත හැකි බවත්, වෙනත් තෘතියික සේවා මට්ටමට අයත් තනතුරුවල සේවයේ නියුතු නිලධරයන් සඳහා එකී තීරණ අදාළ කරගත නොහැකි බවත් ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST-2/05/POL/0092-I හා 2023.03.30 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත.

04. ඒ අනුව, ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් යොමු කර ඇති ඉහත පළමු හා තෙවන ඡේදවල සඳහන් ලිපි පිටපත් www.psc.cp.gov.lk යන වෙබ් අඩවියේ පළකර ඇති අතර (භාගත කිරීම් තුළ), මේ සම්බන්ධයෙන් අදාළ සියළු නිලධාරීන් දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ආයතන අංශය
தாபனப் பிரிவு
Establishments Division

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07. சுதந்திர சதுக்கம், கொழும்பு 07. Independence Square, Colombo 07.

දුරකථන / தொலைபேசி / Telephone : 011-2696211-13
ෆැක්ස් / தொலைநகல் / Fax : 011-2692158
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail : dpe@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website : www.pubad.gov.lk


17 JAN 2023

තැපැල් අංශය 16 JAN 2023

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No | EST-2/05/POL/0092-I | ඔබේ අංකය / உமது இல. / Your No | කා.ද/ප/04/05/01/04 | දිනය / திகதி / Date | 2023.01.10 |

අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික දෙපාර්තමේන්තුව

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව රාජ්‍ය නිලධාරීන් විසින් අත්හැර ගත යුතු රාජ්‍ය භාෂා ප්‍රවීණතාව</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරන ලද ඔබේ සමාංක හා 2022.11.16 හා 2022.07.07 දිනැති ලිපි හා සම්බන්ධ වේ.

02. ඉහත 2022.07.07 දිනැති ලිපිය මගින් විමසා ඇති කරුණු සම්බන්ධයෙන් 2022.12.16 දින රැස් වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි 06 ඡේදයේ සඳහන් නියාමන කමිටුව විසින් පහත සඳහන් තීරණ ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

i. කළමනාකරණ සේවා නිලධාරී සේවයේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව හෝ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කර ඇති නිලධරයන්, කළමනාකරණ සේවා නිලධාරී අධිශ්‍රේණියේ පරිපාලන නිලධාරී තනතුරට උසස්වීම් ලද පසුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කිරීම සඳහා පැය 200 ක භාෂා පුහුණු පාඨමාලාවක් නැවත හැදෑරීම අවශ්‍ය නොවන බව තීරණය කරන ලදී.

ii. 2007.07.01 දිනට පෙර කළමනාකරණ සේවා නිලධාරී සේවයේ පත්වීම් ලද නිලධරයන්, 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 නිකුත් කිරීමෙන් පසුව කළමනාකරණ සේවා අධිශ්‍රේණියේ පරිපාලන නිලධාරී තනතුරට උසස්වීම් ලද පසු අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කිරීම සඳහා පැය 200 ක භාෂා පුහුණු පාඨමාලාවක් සම්පූර්ණ කිරීම අවශ්‍ය නොවන බව තීරණය කරන ලදී.

චන්දන කුමාරසිංහ
ආයතන අධ්‍යක්ෂ ජනරාල්


දුරකථන : 011-2693886
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ade-ii@pubad.gov.lk

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government
ආයතන අංශය
தாபனப் பிரிவு
Establishments Division

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07. சுதந்திர சதுக்கம், கொழும்பு 07. Independence Square, Colombo 07.

| | | | |
|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி : 011-2696211-13<br>Telephone | ෆැක්ස්<br>பெக்ஸ் : 011-2692158<br>Fax | ඊ-මේල්<br>ஈ-மெயில் : dge@pubad.gov.lk<br>E-mail | වෙබ් අඩවිය<br>இணையதளம் : www.pubad.gov.lk<br>Website |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல :<br>My No | EST-2/05/POL/0092 - I | ඔබේ අංකය<br>உமது இல :<br>Your No | CPC/PSC/1/9 | දිනය<br>திகதி :<br>Date | 2023.03.30 |

ලේකම්
මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව

<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව රාජ්‍ය නිලධාරීන් විසින් අත් කරගත යුතු රාජ්‍ය භාෂා ප්‍රවීණතාව</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මා වෙත යොමු කරන ලද ඔබේ සමාංක හා 2023.03.16 දිනැති ලිපිය හා සම්බන්ධ වේ.

02. මගේ සමාංක හා 2023.01.10 දිනැති ලිපිය මඟින් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී ඇති 2022.12.16 දින රැස් වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි 06 ඡේදයේ සඳහන් නියාමන කමිටුව විසින් ගන්නා ලද තීරණය, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරී අධි ශ්‍රේණියේ නිලධරයන් සඳහා අදාළ කර ගත හැකි අතර වෙනත් තෘතියික සේවා මට්ටමට අයත් තනතුරුවල සේවයේ නියුතු නිලධරයන් සඳහා එකී තීරණය අදාළ කර ගත නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි.

වන්දන කුමාරසිංහ
ආයතන අධ්‍යක්ෂ ජනරාල්

දුරකථන : 011-2693886
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ade-ii@pubad.gov.lk